# රත්නපුර මහා නගර සභාව
# තුන්වන වරට ටෙන්ඩර් කැඳවීමයි
# සේවා සහ ස්ථාන 2019 වර්ෂයට බදු දීම

රත්නපුර මහා නගර සභාවට අයත් පහත දැක්වෙන සේවා සහ ස්ථාන 2019 වර්ෂයට බදු දීම සඳහා තුන්වන වරට ටෙන්ඩර් කැඳවනු ලැබේ.

- ලංසු අයදුම්පත් නිකුත් කිරීම ආරම්භ කරනු ලබන දිනය -2019/01/17
- ලංසු අයදුම්පත් නිකුත් කිරීම අවසන් කරනු ලබන දිනය හා වේලාව -2019/02/06 ප.ව 3.00
- ලංසු අයදුම්පත් භාරගැනීම අවසන් කර මුද්‍රා තබන දිනය හා වේලාව -2019/02/07 පෙ.ව 10.00
- ලංසු විවෘත කරනු ලබන දිනය හා වේලාව -2019/02/07 පෙ.ව 10.30

- පොදු වෙළඳපල මාළු කඩ (කඩ අංකය 35)
- පොදු වෙළඳපල මාළු ලෑලි 06 ක් පවත්වාගෙන යාම සඳහා
- පොදු වෙළඳපල එළු මස් /කුකුල් මස් කඩ (කඩ අංකය 42)
- මහජනපොළ භූමියේ ඌරු මස් කඩයක් පවත්වාගෙන යාම
- පොදු වෙළඳපල එළවළු /සිල්ලර වෙනත් කඩ ( මස් / මාළු / මත්පැන් හැර) (කඩ අංකය 39/40/44 )
- මධ්‍යම බස්නැවතුම්පල අභ්‍යන්තර වැසිකිළි පද්ධතිය පවත්වාගෙන යෑම
- ලක්ෂ්මි සිනමාහල අසල පොදු වැසිකිළිය පවත්වාගෙන යෑම
- පුළුගුපිටිය පොදු වැසිකිළිය පවත්වාගෙන යෑම
- දෙමුවාවත පොදු වැසිකිළිය පවත්වාගෙන යෑම
- පොදු වෙළඳපොල ඉදිරිපිට රථගාල
- දෙමුවාවත මැණික් වෙළඳ සංකීර්ණය අසල රථගාල

නාගරික කොමසාරිස් මහා නගර සභාව රත්නපුර

ටෙන්ඩර් කොන්දේසි හා වෙනත් විස්තර සතියේ වැඩ කරන දින වල රත්නපුර මහා නගර සභාවේ දුරකථන අංක 045-2222275/045-2222759/045-2231900 මගින් විමසා හෝ සතියේ වැඩ කරන දිනවලදී 2019.01.17 වන දින සිට 2019.02.07 වන දින දක්වා පෙ.ව 8.30 සිට ප.ව 3.00 දක්වා පැමිණ ලබාගත හැක.

# රත්නපුර මහා නගර සභාව - තුන්වන වරට ටෙන්ඩර් කැඳවීමයි
# සේවා සහ ස්ථාන 2019 වර්ෂයට බදු දීම

රත්නපුර මහා නගර සභාවට අයත් පහත උපලේඛනයෙහි දක්වා ඇති සේවා සහ ස්ථාන 2019 වර්ෂයට බදු දීම සඳහා තුන්වන වරට ටෙන්ඩර් කැඳවනු ලැබේ.

- ❖ ලංසු අයදුම්පත් නිකුත් කිරීම ආරම්භ කරනු ලබන දිනය -2019/01/17
- ❖ ලංසු අයදුම්පත් නිකුත් කිරීම අවසන් කරනු ලබන දිනය හා වේලාව -2019/02/ 06 ප.ව 3.00
- ❖ ලංසු අයදුම්පත් භාරගැනීම අවසන් කරනු ලබන දිනය හා වේලාව -2019/02/07 පෙ.ව 10.00
- ❖ ලංසු විවෘත කරනු ලබන දිනය වේලාව -2019/02/07 පෙ.ව 10.30

***උපලේඛන 01***

| | සේවා සහ ස්ථාන | අවම මාසික ගාස්තුව | | අයදුම්පත් ගාස්තු | ටෙන්ඩර් ඇපතැන්පත් |
|---|---|---|---|---|---|
| 01 | පොදු වෙළඳපොළ මාළු කඩ අංක 35 | කඩ අංක 35 | රු:45,000.00 | රු:2,000.00 | රු:10,000.00 |
| 2 | මාළු ලැලි 06 ක් පවත්වාගෙන යාම සඳහා | අංක 1 | රු: 12,000.00 | රු:1,000.00 | රු: 2,500.00 |
| | | අංක 2 | රු: 12,000.00 | රු:1,000.00 | රු: 2,500.00 |
| | | අංක 3 | රු: 12,000.00 | රු:1,000.00 | රු: 2,500.00 |
| | | අංක 4 | රු: 12,000.00 | රු:1,000.00 | රු: 2,500.00 |
| | | අංක 5 | රු: 12,000.00 | රු:1,000.00 | රු: 2,500.00 |
| | | අංක 6 | රු: 12,000.00 | රු:1,000.00 | රු: 2,500.00 |
| 3 | පොදු වෙළඳපල එළු මස් /කුකුල් මස් / (කඩ අංකය (42) | කඩ අංකය 42 | රු:75,000.00 | රු:2,500.00 | රු: 10,000.00 |
| 4 | මහජනපොළ භූමියේ ඌරු මස් කඩයක් පවත්වාගෙන යාම | - | රු:75,000.00 | රු:2,500.00 | රු: 10,000.00 |
| 5 | පොදු වෙළඳපොළ එළවළු /සිල්ලර වෙනත් කඩ (මස් / මාළු / මත්පැන් හැර) (කඩ අංකය 39/40/44 ) | කඩ අංකය 39 | රු:10120,00.00 | රු:1000.00 | රු:10,000.00 |
| | | කඩ අංකය 40 | රු:10120,00.00 | රු:1,000.00 | රු:10,000.00 |
| | | කඩ අංකය 44 | රු:10,000.00 | රු:1,000.00 | රු:10,000.00 |
| 6 | මධ්‍යම බස්නැවතුම්පොළ අභ්‍යන්තර වැසිකිළි පද්ධතිය පවත්වාගෙන යෑම (අයකිරීම රු:10.00) | | රු:380,000.00 | රු:25,00.00 | රු:25,000.00 |
| 8 | ලක්ෂ්මි සිනමාහල අසල පොදු වැසිකිළිය පවත්වාගෙන යෑම (අයකිරීම | | රු:4,000.00 | රු:250.00 | රු:2,000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු:10.00) | | | | |
| 9 | පුළුගුපිටිය පොදු වැසිකිළිය (අයකිරීමරු:10.00) | | රු:6,000.00 | රු:250.00 | රු:2,500.00 |
| 10 | දෙමුවාවත පොදු වැසිකිළිය | - | රු.4000.00 | රු250.00 | 2000.00 |
| 11 | පොදු වෙළඳපොළ ඉදිරිපිට රථගාල | | රු.20000.00 | රු.2500.00 | රු.20000.00 |
| 12 | දෙමුවාවත මැණික් වෙළඳ සංකීර්ණය අසල රථගාල | | රු.20000.00 | රු.2500.00 | රු.20000.00 |

නාගරික කොමසාරිස්

මහා නගර සභාව

රත්නපුර

## රත්නපුර මහා නගර සභාවට අයත් සේවා සහ ස්ථාන 2019 වර්ෂයට තුන්වන වරට ටෙන්ඩර් කැඳවීම

### 1 වන කොටස - ලංසුකරුවන්ට උපදෙස්

**1.1** ඉහත සඳහන් අයිතමයන් සඳහා රත්නපුර මහා නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

**1.2** එක් අයදුම්කරුවෙක් සඳහා එක් අයිතමයකට එක් අයදුම්පතක් පමණක් නිකුත් කරනු ලැබේ. ලංසු අයදුම්පත් වෙන වෙනම ලබාගෙන තමන් බදු පදනම මත ලබා ගැනිමට අදහස් කරන එක් එක් අයිතමයන් සඳහා වෙන වෙනම ලංසු ඉදිරිපත් කල යුතුය. නියමිත ගාස්තු ද වෙන වෙනම ගෙවිය යුතුය.

**1.3** සෑම ටෙන්ඩර් අයදුම්පතකම අයදුම්කරුගේ අත්සන නියමිත ස්ථානයේ තබා තිබිය යුතුය.

**1.4** ඉදිරිපත් වන ලංසු කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා අයදුම්පත් ලබා ගැනිමට පෙර ලංසුකරුවන්ගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

**1.5** 2019/01/17 දින සිට 2019/02/06 දින දක්වා සතියේ වැඩ කරන දින වල පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා රත්නපුර මහ නගර සභා කාර්යාලයේදී අදාළ ගාස්තු ගෙවීමෙන් පසු ටෙන්ඩර් අයදුම්පත් ලබා ගත හැක.

**1.6** ඉහත 1.5 යටතේ සඳහන් කර ඇති කාර්යාල වේලාව තුළ අයදුම්පත් පිළිබඳ කුමන හෝ පැහැදිලි කර ගැනිමක් හෝ වැඩිමනත් තොරතුරු දුරකථන අංක : 0452222275/0452222759 /0452231900) මඟින් නාගරික කොමසාරිස් හෝ නාගරික ගණකාධිකාරි මඟින් ලබා ගත හැක.

**1.7** ලංසු ලේඛනයට නියමිත ඇප තැන්පත් ලදුපත්වල ඡායා පිටපත් සමඟ අදාළ ආකෘතියේ සඳහන් පරිදි ඇතුලත් කර ටෙන්ඩර් කොන්දේසිවලට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.

**1.8** කැඳවා ඇති ලංසුව ලංසු කොන්දේසි හා නියමයන් පිළිබඳව මනා අවබෝධයකින් ලංසුකරුවන් විසින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. නොදැනුවත්කම හෝ ලංසු අයදුම්පත් සම්පූර්ණ කිරිමේදී වන අතපසු වීම් මත කරනු ලබන ඉල්ලීම් කිසිදු හේතුවක් නිසාවත් සලකා බලනු නොලැබේ. වැඩි දුරටත් අවශ්‍ය තොරතුරු හා පෙර පැහැදිලි කිරීම් රත්නපුර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් හෝ නාගරික ගණකාධිකාරි වෙතින් ලබා ගත හැක.

**1.9** 2019/02/07 වන දින පෙරවරු 10.00 ට ලංසු අයදුම්පත් භාර ගැනීම අවසන් කර (Close) මුද්‍රා තබා එදිනම පෙරවරු 10.30ට ලංසුකරුවන් හෝ ඔහුන්ගේ බලය පවරන ලද නියෝජිතයන් ඉදිරිපිට දී රත්නපුර මහා නගර සභාවේ රැස්වීම් ශාලාවේ දී සියලුම ලංසු පත් විවෘත කරනු ලැබේ.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව ,
රත්නපුර.

## 2 වන කොටස - ටෙන්ඩර් පිළිවෙත හා කොන්දේසි

### 2.1 ලංසු කැඳවීමේ මාදිලිය නොහොත් ක්‍රමය

ලංසු කැඳවීමේ විස්තර කර ඇති පරිදි නිකුත් කර ඇති ආකෘති පත්‍ර වල පමණක් ලංසු ඉදිරිපත් කල යුතු අතර, වෙනත් ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී සෑම ලංසුවක්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. "මුල් පිටපත" සහ "දෙවන පිටපත" කවර දෙකක බහා එම කවර වල "මුල් පිටපත" සහ "දෙවන පිටපත" යනුවෙන් ලකුණු කර මුද්‍රා තැබිය යුතුය. එම කවර දෙකම එක් කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතු අතර සෑම කවරයකම වම්පස ඉහළ කෙළවරේ අදාළ අයිතමය (ඉල්ලන ලද ටෙන්ඩරය) සඳහන් කළ යුතුවේ. 2019/02/07 පෙරවරු 10.00 ට පෙර රත්නපුර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්තුමියගේ නිල කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීම හෝ නාගරික කොමසාරිස් මහා නගර සභාව රත්නපුර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

### 2.2 ලංසු අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මාසික ගාස්තු හා අයදුම්පත් ගාස්තුව සඳහා VAT හා NBT අයකරනු ලැබේ.

### 2.3 ලංසු සඳහා ඇප

අ. සෑම ලංසුකරුවෙකු විසින්ම ඉදිරිපත් කරනු ලබන අයිතමයට අදාළ ලංසු ඇපතැන්පතු රත්නපුර මහා නගර සභාවේ තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියේ ජායා පිටපත් ලංසු මුල් පිටපතට අමුණා ඉදිරිපත් කළ යුතුය.

ආ. ලංසු ඇපතැන්පතු රහිතව ඉදිරිපත් කර ඇති සෑම ලංසුවක්ම අවලංගු කර ප්‍රතික්ෂේප කරන අතර එවැනි ලංසු පිළිබඳ ඉදිරියේදී කිසිදු සැලකිල්ලක් හෝ සහනයක් නොදෙන බව දැන ගත යුතුය.

ඇ. ලංසු ප්‍රදානය අවසන් කල පසු තෝරාපත් කර ගනු ලැබූ ලංසු කරුවන්ගේ හැර අනෙකුත් ලංසු කරුවන් විසින් ඉදිරිපත් කරන ලද මුදල් ඇප තැන්පත් ඔවුන් වෙත ආපසු ගෙවනු ලැබේ.

ඈ තෝරා ගනු ලැබූ ලංසුකරු ලංසු ප්‍රදානය පිළිබඳ දැන්වීමෙන් පසු නියමිත දිනට ඇප මුදල් ගෙවා ගිවිසුම් ගත වීමට අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ ඔහුගේ මුදල් රාජසන්තක කරනු ලැබේ. තෝරාගත් ලංසුකරු ඇප මුදල සම්පූර්ණයෙන් ගෙවා ගිවිසුම්ගත වූ පසු මුදල් ඇපකරය ආපසු ගෙවනු ලැබේ. මුදල් ඇපකරය සඳහා කිසිදු පොලී මුදලක් ගෙවනු නොලැබේ.

### 2.4 ප්‍රමාද ලංසු අයදුම්පත්

දැන්වීමේ සඳහන් පරිදි ලංසු ඉදිරිපත් කිරීමට නියම කර ඇති වේලාවට පසුව ලැබෙන සියලුම ලංසු විවෘත නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 2.5 ලංසුපත්වල වලංගුතාවය

සෑම ලංසුවක්ම ඒවා භාරගනු ලබන දින සිට ඉදිරියට වර්ෂයක කාලයක් නීත්‍යානුකූලව වලංගු වන්නේය.

### 2.6 ලංසු ලේඛන පිළිබඳ පැහැදිලි කිරීම

ලංසුකරුවන් ලංසු පිළිබඳ කොන්දේසි සහ ලංසුව පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත යුතුය. නොදැනුවත්කම හෝ ලැබුණු තොරතුරු ප්‍රමාණවත් නොවන බව මත කරනු ලබන කිසිම ඉල්ලීමක් භාරගනු නොලැබේ. වැඩිදුරටත් අවශ්‍ය පැහදිලි කර ගැනීම් රත්නපුර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් හෝ නාගරික ගණකාධිකාරි මඟින් ලබා ගත හැක.

## 2.7 ලංසු භාරගැනීම හා විවෘත කිරිම

2019.02.07 වන දින පෙරවරු 10.00 ට ලංසු අයදුම්පත් භාර ගැනීම (Close) අවසන් කර මුද්‍රා තබා එදිනම පෙරවරු 10.30 ට රත්නපුර මහා නගර සභාවේ රැස්වීම් ශාලාවේදී ලංසුකරුවන් හෝ ඔවුන් විසින් බලය පවරන ලද නියෝජිතයන් ඉදිරිපිටදී ලංසු විවෘත කරණු ලැබේ.

## 2.8 ලංසු ප්‍රදානය කිරීම

ලංසු සම්බන්ධ කටයුතු නිමවී ලංසුව පිලිගැනීම , ලංසු අයදුම්පතේ දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් දැනුම්දෙනු ලැබේ.

## 2.9 ගිවිසුම් අත්සන් කිරීම

පිළිගත් ලංසුකරු විසින් ත්‍රෛමාසික ඇප මුදල ගෙවිමෙන් අනතුරුව රත්නපුර මහා නගර සභාව සමඟ බදු ගිවිසුමකට එළඹිය යුතුය. එයට වැය වන මුද්දර ගාස්තු VAT ,NBT හා බදු බලපත්‍ර ගාස්තු හෝ වෙනත් ගාස්තු වෙතොත් ඒවා ගෙවීමේ වගකීම ලංසුකරු හට පැවරේ.

**2.10** මධ්‍යම බස්නැවතුම්පල අභ්‍යන්තර වැසිකිළි පද්ධතිය පවත්වාගෙන යාම. ඇප තැන්පත් මුදල ගෙවීමේදී පළමු වාරිකය ටෙන්ඩර් ලබා ගැනීමේදි ද ඉතිරි මාස දෙකේ ඇප තැන්පත් මුදල ටෙන්ඩරය පිරිනැමු දිනයේ සිට මාස තුනක් ඇතුලත ගෙවිය යුතුය.

**2.11** ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සී.එම්.කෝට්ටවත්ත,
නාගරික කොමසාරිස්,
මහ නගර සභාව,
රත්නපුර.